රුහුණ විශ්වවිද්‍යාලය

**2016/2017 ශාස්ත්‍රවේදී (විශේෂ/සාමාන්‍ය) උපාධි 3000 ස්ථලය**

**දෙවන සමාසික පරීක්ෂණය - 2018 මැයි**

# ECN32513/ECN32613 - ශ්‍රී ලංකාවේ ආර්ථිකය

ප්‍රශ්න <u>හතරකට (04)</u> පමණක් පිළිතුරු සපයන්න.

**කාලය : පැය 03 යි.**

---

01. (i) "1977 ට පෙර ශ්‍රී ලංකාවේ ආර්ථිකය එක තැන පල්වන තත්ත්වයට පත්වීමට හේතු වූයේ අභ්‍යන්තරාභිමුඛ ආර්ථික ප්‍රතිපත්තීන් හා ඉහළ රාජ්‍ය මැදිහත්වීම් නිසා පෞද්ගලික අංශයේ ක්‍රියාකාරීත්වය යටපත් කිරීමට කටයුතු කිරීමයි." ඉහත ප්‍රකාශය සනාථ කිරීමට ප්‍රමාණවත් හේතු සපයන්න.

(ලකුණු 07)

(ii) "1977 දී හඳුන්වාදුන් බාහිරාභිමුඛ වෙළෙඳපොළ ආර්ථික ප්‍රතිපත්ති රාමුව ශ්‍රී ලංකාවේ ඉතිහාසය තුළ කඩඉමක් සනිටුහන් කරන අතර සාපේක්ෂ වශයෙන් අභ්‍යන්තරාභිමුඛ ආර්ථික ප්‍රතිපත්තියට වඩා යහපත් වෙයි."

(අ) ශ්‍රී ලංකාවේ ඉතිහාසය තුළ "කඩඉමක් සනිටුහන් කිරීම" යනුවෙන් කුමක් අදහස් වේ ද?

(ලකුණු 04)

(ආ) අභ්‍යන්තරාභිමුඛ ආර්ථික ප්‍රතිපත්තියට වඩා බාහිරාභිමුඛ ප්‍රතිපත්තිය යහපත් වන්නේ කෙසේදැයි ඔබට කෙසේ කිව හැකි ද?

(ලකුණු 04)

02. (i) ශ්‍රී ලංකා ආර්ථිකය ඉදිරියේ ඇති ප්‍රධාන සාර්ව ආර්ථික අභියෝග මොනවා ද?

(ලකුණු 09)

(ii) ශ්‍රී ලංකාවේ ඉදිරි ආර්ථිකයේ ප්‍රගතිය වලක්වාලන බැරෑරුම් සාර්ව ආර්ථික නොවන ආර්ථික අභියෝග පැහැදිලි කරන්න.

(ලකුණු 06)

03. (i) ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික අංශයේ ප්‍රගතිය සීමා කරන බාධකයන් මොනවා ද?

(ලකුණු 07)

(ii) ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ පවත්නා ඉදිරි කෘෂි නිෂ්පාදනය වැඩිදියුණු කළ හැකි ප්‍රධාන සාධක මොනවා ද?

(ලකුණු 08)

04. (i) ශ්‍රී ලංකාවේ සෘජු විදේශ ආයෝජන ප්‍රවාහයන්ගේ වර්තමාන තත්ත්වය කුමක් ද?

(ලකුණු 08)

(ii) ශ්‍රී ලංකාවට සෘජු විදේශ ආයෝජන වේගවත් ලෙස ගලා ඒම වර්ධනය වීම බාධා කෙරෙන සාධක කවරේ ද?

(ලකුණු 07)

05. (i) සීඝ්‍ර ආර්ථික සංවර්ධනය තුළ යහපත් ආණ්ඩුකරණයේ (යහපාලනයේ) කාර්යභාරය කුමක් ද?

(ලකුණු 05)

(ii) ශ්‍රී ලංකාවේ යහපත් ආණ්ඩුකරණය සහ ආර්ථික සංවර්ධනය දේශපාලන අස්ථායිතාවය විසින් වලක්වාලනුයේ කෙසේ ද?

(ලකුණු 05)

(iii) ශ්‍රී ලංකාවේ යහපත් ආණ්ඩුකරණය වලක්වාලන සාධක කවරේ ද?

(ලකුණු 05)

06. මෑත කාලය තුළ ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය අවම කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවා ද?

(ලකුණු 15)

07. ශ්‍රී ලංකාවේ වැඩිහිටි ජනගහනය වැඩිවීමේ ආර්ථික හා සමාජ ප්‍රතිවිපාක මොනවා ද?

(ලකුණු 15)

@@@@@@@@@